# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1462/25– 2006 සැප්තැම්බර් 14 වැනි බ්‍රහස්පතින්දා – 2006.09.14

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය – සංශෝධන අංක 01

2004 දෙසැම්බර් මස 24 වැනි දින හා අංක 1372/23 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර තිබේ:

(i) 5: 2 යන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කරනු ලැබේ :

5: 2 – II වන පන්තියේ නිලධරයන් එම පන්තියට පත් වූ දිනයේ සිට හතර වන වැටුප් පියවරට එළඹීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ ය. අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් පවත්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයකින් පළමු කාර්යක්ෂමතා කඩඉම සමන්විත වේ. ( XII පරිශිෂ්ටය ) II වන පන්තියේ නිලධරයන් එම පන්තියට පත් වූ දිනයේ සිට 07 වන වැටුප් පියවර එළඹීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම පිළිබඳ අවශ්‍යතාවය ද සම්පූර්ණ කළ යුතුය. දෙවන කාර්යක්ෂමතා කඩඉම 5: 2:1 උප වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි දෙවන භාෂා පරීක්ෂණයකින් සමන්විත ය.

(ii) 5 : 2 : 1 උපවගන්තියේ අවසානයට පහත සඳහන් වාක්‍යය ඇතුළත් කරනු ලැබේ :

“ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බැඳුන නිලධරයන් සිංහල හා දෙමළ යන රාජ්‍ය භාෂා දෙකම ඉහත දැක්වෙන අවම අවශ්‍යතාවයන්ට යටත්ව සමත් විය යුතුය”.

(iii) 5 : 3 යටතේ පහත සඳහන් පරිදි නව උපවගන්තියක් ඇතුලත් කරනු ලැබේ :

5 : 3 – සෑම වසරකම දෙවරක් එක් එක් පන්තියේ කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු කෙරේ. මෙම විභාග ජනවාරි සහ ජූලි මාසවල පැවැත්වීමට නියමිතය.

(iv) 14 : 3 : 1 යටතේ පහත සඳහන් පරිදි නව උපවගන්තියක් ඇතුළත් කරනු ලැබේ :

14: 3 : 1 – 14.1 හා 14.2 ඡේදය ප්‍රකාරව අන්තර්ග්‍රහණය කරන ලද නිලධරයන් අන්තර්ග්‍රහණය වූ දින සිට 2006.12.31 දින දක්වා වන අන්තර්කාලය තුළදී ඔවුන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමට පෙර අයත්ව සිටි පූර්ව සේවාවන්හි සේවා ව්‍යවස්ථාවන්වල සඳහන් උසස්වීම් ක්‍රමය අනුව ඊළඟ පන්තියට උසස්වීම් ලැබීමට සුදුසුකම් ලබාගෙන ඇත්නම් එම සුදුසුකම් සම්පූර්ණ කළ දින සිට ඔවුන් එලෙස උසස්වීමට සුදුසුකම් ලැබූ පූර්ව සේවයේ පන්තියට අනුරූපීව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ පන්තියට උසස් කරනු ලැබීමට හිමිකම් ලබයි. මේ අනුව 14 : 2 වගන්තිය යටතේ එන සටහන ඉවත් කරනු ලැබේ.

(v) 14 : 3 : 2 යටතේ පහත සඳහන් පරිදි නව උපවගන්තියක් ඇතුළත් කරනු ලැබේ :

14: 3 :2 – 2003.12.31 දින හෝ ඊට පෙර දිනක කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවය සම්පූර්ණ කළ යුතු නිළධරයන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවාවේ XII වන පරිශිෂ්ඨය යටතේ පළමුවරට පවත්වනු ලබන II වන පන්තියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වුවහොත් ඔවුන් පූර්ව සේවා ව්‍යවස්ථාව යටතේ නියමිත දින අදාල විභාගය සමත් වූවා සේ සලකා කටයුතු කරනු ඇත. අනෙකුත් නිළධරයන්ට සේවා ව්‍යවස්ථාවේ 14: 3 :4 නව උපවගන්තියේ විධිවිධාන තවදුරටත් බලපවත්වනු ඇත.

(vi) 14:3:3 යටතේ පහත සඳහන් පරිදි නව උපවගන්තියක් ඇතුළත් කරනු ලැබේ :

14:3:3 – සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය ප්‍රකාශ කිරීමට දී ඇති අවසන් දිනයට ( 2005.03.23 ) මනාපය ප්‍රකාශ කිරීමට නොහැකි වූ, ඒ වන විටත් සේවයේ නියුක්ත නොවූ සිය ධූරය හැරගියා සේ සලකා ඇත්තා වූ හෝ සේවය අවසන් කළ හෝ වැඩ තහනමකට ලක් වූ අයෙකු සම්බන්ධයෙන් නැවත සේවයේ පිහිටුවීමට විනය බලධාරියා විධිමත් නියෝගයක් දී ඇති කල්හි එවැන්නෙකුට සේවයට අන්තර්ග්‍රහණය වීමට හෝ පූර්ව සේවය යටතේ අවසන් වරට සේවය කළ දිනට පූර්ව සේවයෙන් විශ්‍රාම යාමට හෝ තම මනාපය පළ කිරීමට එක් ලිත් මාසයකට නොවැඩි කාලයක් කල් දිය යුතු වේ. ඔවුන් ද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 හා 7 වගන්ති යටතේ විශ්‍රාම ගැන්වීමේ වරප්‍රසාදවලට හිමිකම් ලබනු ඇත. ඉහත සඳහන් නොවන ආකාරයේ කවරකු හට හෝ මෙම උපවගන්තියේ විධිවිධාන අදාල නොවනු ඇත.

(vii) 14 : 3 වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ :

14: 3 : 4 - ව්‍යවස්ථාව *ගැසට් පත්‍රයේ* පළ කළ දිනට සේවයේ සිටි නිළධාරීන් සම්බන්ධයෙන් මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන අදාල වීමට ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනයේ සිට විභාග අවස්ථා 06ක සහන කාලයක් දෙනු ලැබේ. එම කාලය තුළ ඔවුන් විසින් නව සේවා ව්‍යවස්ථාවේ ඇතුළත් කර ඇති සුදුසුකම් සපුරා ගත යුතුය. මෙහිලා සුදුසුකම් යනුවෙන් අදහස් කරනුයේ II පන්තිය කාර්යක්ෂමතා කඩඉම හා දෙවන භාෂාව සමත්වීම වේ. II වන පන්තියේ කාර්යක්ෂමතා කඩඉම දැනටමත් සමත් වී ඇති නිළධරයන් දෙවන භාෂාව පිළිබඳ අවශ්‍යතාවය සම්පූර්ණ කළ යුතු නොවේ.

(viii) 14 : 3 : 5 යටතේ පහත සඳහන් පරිදි නව උපවගන්තියක් ඇතුළත් කරනු ලැබේ :

14 : 3: 5 - රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ උසස්වීම් හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටින විභාග අපේක්ෂකයන්ට තමන් සේවයට ඇතුළු වූ භාෂා මාධ්‍යය හෝ වෙනත් රාජ්‍ය භාෂාවකින් විභාගවලට පිළිතුරු සැපයිය හැකි වේ.

ඒ. නෝබට්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2006 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ 07,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

09–873

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.